*සැ. යු.-* 2016.08.05 දින පළවූ අංක 1979 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළනොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,980 - 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2016.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1474 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1486 |

*සැ. යු.-* මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත 2016 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1471- B 81087— 5,403 (2016/08)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙරාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිළධාරි පුරප්පාඩු**

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිළධාරින් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

(*අ*) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අනුබද්ධිත උපාධි පාඨමාලාවන් සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) විධායක අංශය
(2) විනයාරක්ෂක අංශය
(3) සැපයුම් අංශය
(4) නාවික සෙබල අංශය

මෙම අංශයන් වෙත ඇතුල්වීමේ සුදුසුකම් අපොස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් විෂයයන් 06 කින් සමත් විය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය. පහත එක් එක් අංශයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති පරිදි අපොස (උ/පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් 03ක් සමත්ව තිබිය යුතු අතර අපොස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලකුණු 30ට නොඅඩුව ලබා තිබිය යුතුය. එමෙන්ම අපොස (උ/පෙළ) විභාග ප්‍රතිඵලවලට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා තිබීම. (විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

(1) විධායක අංශය සඳහා - භෞතික විද්‍යා හෝ ජීව විද්‍යා අංශයෙන්
(2) විනයාරක්ෂක/නාවික සෙබල අංශය සඳහා - විද්‍යා, වාණිජ, තාක්ෂණික හෝ කලා අංශයෙන්
(3) සැපයුම් අංශය සඳහා - වාණිජ අංශයෙන්

(*ආ*) සාගරික ඉංජිනේරු විදුලි ඉංජිනේරු උපාධි පාඨමාලාවන්(දේශීය/විදේශීය පුහුණුව) සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ඉංජිනේරු අංශය
(2) විදුලි ඉංජිනේරු අංශය

මෙම අංශයන් වෙත ඇතුල්වීමේ සුදුසුකම් අපොස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් විෂයයන් 06 කින් සමත් විය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබාතිබිය යුතු අතර අපොස (උ/පෙළ) විභාගයෙන් එක් වරක දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව සමත්ව තිබීම සහ අපොස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලකුණු 30ට නොඅඩුව ලබා තිබිය යුතුය. අපොස (උ/පෙළ) විභාග ප්‍රතිඵල වලට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා තිබිය යුතුය. (විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

*සටහන*.- අපොස (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකනු නොලැබේ.

3. *අනෙකුත් සුදුසුකම්* - අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය.

(*අ*) පුරවැසිභාවය - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
(*ආ*) වයස - 2016 අගෝස්තු මස 31 වැනි දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22 නොවැඩි විය යුතුයි.
(*ඇ*) උස - සෙ. මී. 168 ට නොඅඩු විය යුතුයි. (විනයාරක්ෂක අංශය සඳහා සෙ. මී 171 ට නොඅඩු විය යුතුයි)
(*ඈ*) බර - කිග්‍රෑ 52 ට නොඅඩු විය යුතුයි.
(*ඉ*) පපුව - සෙමී 81 ට නොඅඩු විය යුතුයි.
(*ඊ*) වර්ණ දෘෂ්ඨිය - එස්ටීඩී II.
(*උ*) දෘෂ්ඨි තීක්ෂණත්වය - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව)
(*ඌ*) සිවිල් තත්ත්වය - අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ජේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස,ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි* :

(*අ*) අපේක්ෂයින් අනෙකුත් නිලයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. ආධුනිකයා ලබා ඇති අංශය අනුව මූලික පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිම වීමෙන් පසු ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිලයෙන් වෙනස්ව වැඩ බලන උප ලුතිනන් නිලයේ ස්ථිර අධිකාරියට පත්කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා නාවික හමුදා භෝජනාගාරය තුලින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේ දී ම අදාළ ආධුනිකයා විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකග වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

(ඌ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් එදිනම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන අතර, එයින් සමත් වන අයදුම්කරුවන් පමණක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන අතර එම පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් බඳවාගනු ලැබේ.

(එ) විවාහක නිලධාරින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාල පරිදි අය කරනු ලැබේ.

(ඒ) සියලුම නිලධාරින් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිලධාරින් නාවික නීතිය මගින් පාලනය කරනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා :* තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

8. *වැටුප් හා දීමනා :*

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව

| | | |
|---|---|---|
| (අ) මූලික වැටුප | - | රු. 32,380.00 |
| (ආ) ජීවන වියදම් දීමනාව | - | රු. 7,800.00 |
| (ඇ) නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - | රු. 255.00 |
| (ඈ) දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - | මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඉ) දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - | මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඊ) අනෙකුත් දීමනා | - | විශේෂ දීමනාව රු. 1000.00 |
| | - | විශේෂ අමතර දීමනාව රු. 3000.00 |

*සටහන.-* ශිෂ්‍යභට නිළධාරියාගේ මූලික වැටුප 2020.01.01 දිනට රු.32,380.00 වන අතර 2016.01.01 වැනි දින පහත පරිදි මූලික වැටුප වාර්ෂිකව සංශෝධනය වේ.

| | | | |
|---|---|---|---|
| 2016.01.01 | - රු 18,984.00 | - | ගැළපුම් දීමනාව රු. 9778.00 |
| 2017.01.01 | - රු 22,333.00 | - | ගැළපුම් දීමනාව රු. 6429.00 |
| 2018.01.01 | - රු 25,682.00 | - | ගැළපුම් දීමනාව රු. 3080.00 |
| 2019.01.01 | - රු 29,031.00 | - | නොමැත |
| 2020.01.01 | - රු 32,380.00 | - | නොමැත |

(උ) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු.637.50 ක් ගෙවනු ලැබේ.

(ඌ) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිළධාරියාට, කලත්‍රයාට සහ ළමයින්ට) හිමිවනු ලැබේ.

(එ) කඳවුර තුළ වාසය කරන නිළධාරීන්ට මසකට වරක් නිළධාරී නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(ඒ) නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

(ඔ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඕ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිළධාරීන්ට රු.1,600.00 සිට රු.4,250.00 දක්වා ගෙවල් කුළී දීමනාවන් හිමි වේ.

9. *අයදුම්කරුවන්ට උපදෙස්* :

(*අ*) පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 31 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්), නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙළවරේ "ආධුනික ශිෂ්‍යභට නිළධාරී තනතුර" යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-2215154 මඟින් ලබා ගත හැක.

(*ආ*) රාජ්‍ය සේවයේ/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ / ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය. (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය.)

(2) අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික.

(3) පාසල් හැරයාමේ සහතිකය.

(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය.

(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(6) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(7) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(*ඈ*) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(*ඉ*) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

(*ඊ*) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

10. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමටද යටත් වේ.

11. *තෝරා ගැනීමේ/සම්මුඛ පරීක්ෂණ ආදිය* :

(*අ*) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(*ආ*) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා :

| *ව්‍යායාමය* | *වාර ගණන* | *කාලය (මිනිත්තු/තත්පර)* |
|---|---|---|
| මීටර් 1600 දිවීම | - | මිනිත්තු 06 - 08 අතර |
| Push Up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Sit Up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Arm Bending | 05 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Standing Board Jump | 242 සෙමී හෝ ඊට වැඩි | - |
| Rope Climbing | - | - |
| Shuttle Run | - | තත්පර 11 |

(*ඇ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(ඈ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුණුම්පත ඔහු විසින් ඉදිරිපත් කල යුතුය.

(ඉ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඊ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

(උ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

සටහන.— මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රිත්වයෙන්ම පළවන අතර යම්කිසි නීත්‍යානුකූල තත්වයකදී සිංහල භාෂාවෙන් පළවන *ගැසට්* නිවේදනය නිවැරදි *ගැසට්* නිවේදනය ලෙස පිළිගනු ලබයි.

ආර්. සී. විජේගුණරත්න,
ඩබ්වී, ආර්ඩබ්පී.,* ආර්එස්පී, වීඑස්වී,
යූඑස්පී, එන්ඩීසී, පීඑස්එන්,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593, කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිළධාරී සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද , ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. තැපැල් ලිපිනය :————.

6. උපන් දිනය :————.

7. වයස ෘ අවුරුදු ....... මාස ....... දින ....... (2016 අගෝස්තු මස 31 වැනි දිනට)

8. උස ෘ...........(සෙ.මී) පපුව ........ (සෙ.මී) බර ........(කි.ග්‍රෑ) :

9. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

10. දිස්ත්‍රික්කය :————.

11. ඡන්ද කොට්ඨාසය :————.

12. ග්‍රාම නිළධාරී කොට්ඨාසය :————.

13. දුරකතන අංකය :————.

14. විවාහක හෝ අවිවාහක බව :————.

15. ස්ත්‍රී පුරුෂ භාවය :————.

16. අධ්‍යාපනය ලැබූ පාසල :————.

17. පාසල සහ හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස . (සා.පෙළ)<br>අ.පො.ස . (උ.පෙළ)<br>වෙනත් | | |

18. පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

21. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම් , දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න) :————.

22. පාසලේදී , විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

23. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

24. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද?එසේ නම් , ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

25. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු හෝ ඇඟ බැඳ තිබේද?එසේනම් විස්තර සඳහන් කරන්න. :————.

26. රජයේ දෙපාර්තමේන්තුවකදී හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු ,ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර , සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

27. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

28. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි.ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාල වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

08-454

---

**ශ්‍රී ලංකා පොලිස් උපසේවාව**

පොලිස් රෝහල

**වෛද්‍ය නිලධාරී පුරප්පාඩු**

පොලිස් රෝහලේ පවත්නා ඉහත සඳහන් වෛද්‍ය නිලධාරී පුරප්පාඩු සපුරාලීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහතින් දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව, සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 වෙත එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර එය ලියා පදිංචි තැපෑලෙන් 2016.09.09 වැනි දින හෝ එදිනට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. ඉන්පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

03. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

(*අ*) එම්.බී.බී.එස් (ශ්‍රී ලංකා) හෝ ඒ හා සමාන වෛද්‍ය උපාධියක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර සහ පූර්ණ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

(*ආ*) වෛද්‍යවරයෙක් වශයෙන් විශේෂිත පුහුණුවීම හෝ පළපුරුද්ද ලබා ඇති අයට පොලිස් රෝහලේ අවශ්‍යතාවයන්ට අනුව ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

04. *වැටුප් හා වෙනත් දීමනා සහ පහසුකම් :*

(*අ*) තෝරා ගන්නා ලද අයදුම්කරුවන්/අයදුම්කාරියන් හට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ගෙවනු ලබන වැටුප හා වැටුප් වර්ධක සමග සියලු දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත. ඊට අමතරව ඔහුට හෝ ඇයට පොලිස් උප සේවාවේ සක්‍රිය සේවයේ යෙදෙන නිලධාරීන්ට ලැබෙන ඇතැම් දීමනා ගෙවනු ඇත.

(*ආ*) රියදුරෙකු සමග නිල රථයක් සේවා අවශ්‍යතාවය අනුව ලැබීමට හිමිකම් ඇත.

05. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

(*අ*) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් / අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලිස් උපසේවාවේ නීති හා රෙගුලාසිවලට අනුකූලව උප සේවා සහකාර පොලිස් අධිකාරී/උප-සේවා කාන්තා සහකාර පොලිස් අධිකාරී නිල මට්ටමින් සක්‍රිය සේවයේ පිහිටවනු ලැබේ.

(*ආ*) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් / අයදුම්කාරියන් දැනට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අයගේ එම සේවා ජ්‍යෙෂ්ඨත්වය නොකඩවා බල පැවැත්වෙනු ඇත.

(*ඇ*) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් / අයදුම්කාරියන් අවුරුද්දක පරිවාස කාලයකට යටත් විය යුතු අතර, අවුරුදු හතරක කාල සීමාවකට සක්‍රිය සේවයේ යොදවනු ලබනු ඇත.

06. *සේවා කොන්දේසි :*

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දක්වෙන පොදු කොන්දේසිවලට බාහිර වන්නාවූ කොන්දේසි.-

(*අ*) තෝරා ගනු ලබන අයදුම්කරුවන් / අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන හෝ කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(*ආ*) තෝරා ගනු ලබන අයදුම්කරුවන් / අයදුම්කාරියන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති චක්‍රලේඛ 1693/2003 සහ 1804/2004 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/ දිවුරුම් දිය යුතුය.

(*ඇ*) සියලුම අයදුම්කරුවන් / අයදුම්කාරියන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දක්වෙන පොදු කොන්දේසි, ආයතන සංග්‍රහයේ පළමුවන සහ දෙවන වෙළුමෙහි විධිවිධාන හා ඊට පරිබාහිරව වන්නා වූ චක්‍රලේඛ හා කොන්දේසි, පොලිස් සේවයේ

නියෝග, පොලිස්පති චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි විධිවිධානවලට යටත්වේ.

(*ඈ*) සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

07. මෙම *ගැසට් පත්‍රයේ* 1 කොටස (II *අ*) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

08. තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. පොලිස් සේවයට නුසුදුසුවන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අයදුම්කරුවන්/අයදුම්කාරියන් පහත දක්වෙන ලිපිලේඛනවල පිටපත් (මුල් පිටපත් එවිය යුතු නොවේ.) ස්වකීය අයදුම්පත්වලට අමුණා එවිය යුතුය. ඃ

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;
(iii) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සහ
(iv) වෘත්තීය පළපුරුද්ද දක්වෙන සහතික.

10. අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් තම අයදුම්පත් අඟල් 11x8 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙලකොට සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතික පිටපත් සමග ඉහත ඡේද අංක 02හි දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හේතුවක් නිසාවත් කිසියම් නිලධාරියෙකු වෙත පුද්ගලිකව භාර නොදිය යුතු ය.

***සටහන.***-මෙම නිවේදනයෙන් දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර, එබඳු අයදුම්කරුවන් / අයදුම්කාරියන් හට මේ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ. මෙහි සඳහන් පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් හට ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. අයදුම්කරනු ලබන තනතුර :―――――.

02. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ (මුලකුරු සමග) නම :―――――.

(i) වාසගම :―――――.
(ii) වෙනත් නම් :―――――.

03. ස්ථිර ලිපිනය :―――――.

ස්ථිර ලිපිනයට අදාළ පොලිස් වසම :―――――.

04. ස්ත්‍රී / පුරුෂ භාවය :―――――.

05. උපන් දිනය :―――――.

2016.09.09 වැනි දිනට වයසඃ- අවු :―――. මාස :―――――. දින :―――――.

06. සිවිල් තත්ත්වය ඃ විවාහක/අවිවාහක/වැන්දඹු
(i) කලත්‍රයාගේ රැකියාව :―――――.
(ii) කලත්‍රයාගේ රැකියා ස්ථානය :―――――.

07. වර්තමාන සේවා තත්ත්වය ඃ-
(i) දැනට දරන තනතුර :―――――.
(ii) දැනට දරන තනතුරේ ශ්‍රේණිය :―――――.
(iii) වර්තමාන සේවා ස්ථානය :―――――.

08. පත්වීම් ලද දිනයන් ඃ-
(i) වර්තමාන තනතුරට පත් වූ දිනය :―――――.
(ii) 11 වන ශ්‍රේණියට පත් වූ දිනය :―――――.
(iii) මුල් පත්වීම් දිනය :―――――.

09. *අධ්‍යාපන සුදුසුකම් (දිනයන් ද සහිතව සම්පූර්ණ විස්තර දක්වන්න)*
(i) වෘත්තීය සුදුසුකම් :―――――.
(ii) පශ්චාත් උපාධි :―――――.

10. දරන ලද තනතුරු ඃ

| | *තනතුර* | *සේවා ස්ථානය* | *සේවා කාලය* |
|---|---|---|---|
| (i) | ...................... | ...................... | ...................... |
| (ii) | ...................... | ...................... | ...................... |
| (iii) | ...................... | ...................... | ...................... |
| (iv) | ...................... | ...................... | ...................... |
| (v) | ...................... | ...................... | ...................... |

11. විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද :―――――.

12. තනතුරට අදාළ වෙනත් සුදුසුකම් :―――――.

ඉහත සඳහන් තොරතුරු, විස්තර සත්‍ය හා නිවැරදි බවට මම සහතික කරමි. මා විසින් සපයන ලද කිසිදු තොරතුරක් අසත්‍ය බවට හෝ තෝරාගනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමට/පත්වීම ලැබීමෙන් පසු සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව පොලිස් සේවයෙන් පහකරනු ලැබීමට ද, මා යටත් වන බව දන්වා සිටිමි.

―――――,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

දිනය :―――――.

08-509

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**තාක්ෂණ සහායක (වාරිමාර්ග) හා තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරුවලට සීමිත පදනමින් බඳවා ගැනීම - 2016**

1.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 3 සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් රජයේ සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | තාක්ෂණ සහායක (වාරිමාර්ග) | 182 | III ශ්‍රේණිය |
| 2 | තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | 19 | III ශ්‍රේණිය |

1.2 තනතුරු රාජකාරි ස්වභාවය :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 1 | තාක්ෂණ සහායක (වාරිමාර්ග) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරයකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන පහත කාර්යයන්,<br>● ක්ෂේත්‍රයේ නව ඉදි කිරීම්, වැඩි දියුණු කිරීම් හා අලුත් වැඩියා කිරීම් සඳහා වන වැඩ පරීක්ෂා කිරීම<br>● වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රමිතීන්ට අනුව එම කටයුතුවල දී පවරනු ලබන වගකීම් ඉටු කිරීම.<br>● අදාළ ක්ෂේත්‍රයේ වාරිමාර්ග හා උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීම යනාදී ව්‍යාපාරවල මෙහෙයුම් හා නඩත්තු වැඩ පරීක්ෂා කිරීම<br>● වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාරිමාර්ග, උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීමේ හා කරදිය වැළැක්වීමේ ව්‍යාපාර, ගොඩනැගිලි, පාරවල් සහ ඒවාට අයත් රක්ෂිත පිළිබඳව අවධානයෙන් සිටීම සහ ආරක්ෂා කිරීම. |
| 2 | තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | යාන්ත්‍රික වැඩපලට අළුත්වැඩියාව සඳහා පැමිණෙන යන්ත්‍ර හා වාහන භාර ගැනීම.<br>යාන්ත්‍රික අංශයට අනුයුක්ත කනිෂ්ඨ සේවකයින්ගේ රාජකාරි අධීක්ෂණය |

2.0 බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* .- අයදුම්කරුවන්ගේ ක්ෂේත්‍රයට අදළ පළපුරුද්ද, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්‍ෂා කිරීමට පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ලබාගන්නා ලකුණුවල අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළපුරුද්ද, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 100 | 40 |

2.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලැබේ.

3.0 වැටුප් පරිමාණය - මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන 1 අනුව රු. 29,840-10x300-11x350-10x560-10x660-48,890 (MT1-2016) වේ. එම චක්‍රලේඛණයේ උපලේඛන II අනුව 2016.01.01 වැනි දින සිට 2016.12.31 දින දක්වා අදළ වනුයේ රු. 17,508 ක මූලික වැටුපක් හා රු.9,831 ක ගැලපුම් දීමනාවකි.

4.0 තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5.0 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව බල නොපායි.

6.0 අවශ්‍ය සුදුසුකම් :

61. *අධ්‍යාපන සුදුසුකම්* : තාක්ෂණ සහායක (වාරිමාර්ග)/තාක්ෂණ සහායක (යාන්ත්‍රික) භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

6.2 *පළපුරුද්ද* :

තාක්ෂණ සහායක (වාරිමාර්ග) - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ PL 2-2006A වැටුප් කේත අංකය යටතේ (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL-2-2016 වැටුප් කේතය) පහත සඳහන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, ප්‍රාථමික අර්ථ ශිල්පීය සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද සහිත වීම හා වසර පහක (5) සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1. ක්‍රියාකරු
2. ට්‍රැක්ටර් ක්‍රියාකරු
3. නඩත්තු හා මෙහෙයුම් කම්කරු
4. ජල පොම්ප ක්‍රියාකරු
5. වායු සමීකරණ අලුත්වැඩියාකරු
6. පෙදරේරු
7. වඩු කාර්මික
8. ජල නළ කාර්මික
9. උපකරණ ශිල්පී
10. උපකරණ අලුත්වැඩියාකරු
11. ජල විද්‍යා මිනුම් සහායක
12. සංචාරක බංගලා භාරකරු
13. ගබඩා කම්කරු
14. සැලසුම් මුද්‍රණකරු
15. සැලසුම් භාරකරු
16. හෝරාමාපක අලුත්වැඩියාකරු

*හෝ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධකාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (සිවිල්) පාඨමාලාව සමත්වී අදළ සහතිකය (NCT-civil) ලබා ගෙන තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම යන වෘත්තීය සුදුසුකම් සපුරමින් අවම වශයෙන් වසර තුනක (03) අඛණ්ඩව සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සහිත රජයේ සේවයේ තනතුරක ස්ථිර පත්වීම් ලබා ඇති නිලධරයකු වීම.

*තාක්ෂණ සහායක (යාන්ත්‍රික)* : වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ PL 2-2006A වැටුප් කේත අංකය යටතේ (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL 2-2016 වැටුප් කේතය) පහත සඳහන් ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත, ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද සහිත වීම හා වසර පහක (5) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1. කාර්මික ශිල්පි
2. විදුලි කාර්මික
3. පෑස්සුම්කරු
4. පින්තාරුකරු
5. වෑද්දුම්කරු
6. ලියවන පට්ටල්කරු
7. කම්මල්කරු
8. යන්ත්‍රකරු
9. බෙලෙක් වැඩකරු
10. සවිකරන්නා
11. සුළු වැඩ පරිපාලක

*හෝ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධකාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (යාන්ත්‍රික) පාඨමාලාව සමත් වී අදළ සහතිකය (NCT - Mechanical) ලබා ගෙන

තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම යන වෘත්තීය සුදුසුකම් සපුරමින් අවම වශයෙන් වසර තුනක (03) අඛණ්ඩ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත රජයේ සේවයේ තනතුරක ස්ථිර පත්වීම් ලබා ඇති නිලධරයකු වීම.

6.3 *කායික සුදුසුකම්* .- සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.4 *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) රජයේ සේවයේ පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
(iii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iv) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.0 ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

8.0 අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. අංක 1.0 සිට 7.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 8.0 සිට 11.0 දක්වා 02 පිටුවේ ද, අංක 12.0 සිට 16.0 දක්වා 03 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

8.2 සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

8.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.4 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

8.5 අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව ''**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට බඳවා ගැනීම හෝ තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීම - සීමිත පදනම**'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

9.0 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

10.0 අයදුම් පත්‍ර යොමු කිරීම :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016 අගෝස්තු මස 29 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. :-

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ඉංජි. එස්. එස්. එල්. වීරසිංහ,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2016 ජූලි මස 27 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) තනතුරට සීමිත පදනමින් බඳවා ගැනීම - 2016*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

(අදාල කොටුව තුළ ලියන්න.)

1.0 අයදුම් කරනු ලබන තනතුරු නාමය :————.

2.0 මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොද) : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.
(*උදා.* PERERA, A. B. C. )

2.1 සම්පූර්ණ නම :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

3.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ලියන්න.)
පුරුෂ - M
ස්ත්‍රී - F

5.0 කාර්යාලයීය ලිපිනය : (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

5.1 පෞද්ගලික ලිපිනය :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

6.0 දුරකථන අංක : ස්ථාවර :————. ජංගම :————.

7.0 පදිංචිය :
7.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
7.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

8.0 විවාහක/අවිවාහක බව :

අවිවාහක -1 විවාහක -2

9.0 උපන් දිනය :

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

9.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2016.08.29 වැනි දිනට) වයස :

අවුරුදු | | | මාස | | | දින | | |

10.0 තනතුර ඃ

10.1 දැනට දරන තනතුර :————.

10.2 ස්ථිර තනතුරට පත්වූ දිනය :————.

11.0 අධ්‍යාපන සුදුසුකම් ඃ

11.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

*පළමුවනවර*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

11.2 අ. පො. ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

*දෙවනවර*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

12.0 වෘත්තීය සුදුසුකම් ඃ

| *හදරා ඇති පාඨමාලාව* | *පිරිනමනු ලැබූ ආයතනය* | *හදරන ලද කාල සීමාව* | *සහතික පත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |

13.0 පළපුරුද්ද :————.

14.0 වෙනත් සුදුසුකම් :————.

15.0 අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය ඃ

.................වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත්

වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නෙගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි. මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම්වල රාජකාරි කිරීමට එකඟ වෙමි.

_________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16.0 දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................. තනතුරෙහි සේවය කරන .............. මහතාගේ/මහත්මියගේ/මෙනවියගේ වැඩ හැසිරීම සතුටුදායකවන බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

_________,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

08-297/1

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**තාක්ෂණ සහායක (වාරිමාර්ග) හා තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2016**

1.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 3 සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | තාක්ෂණ සහායක (වාරිමාර්ග) | 122 | III ශ්‍රේණිය |
| 2 | තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | 13 | III ශ්‍රේණිය |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 1 | තාක්ෂණ සහායක (වාරිමාර්ග) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරයකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන පහත කාර්යයන්,<br>● ක්ෂේත්‍රයේ නව ඉදි කිරීම්, වැඩි දියුණු කිරීම් හා අලුත් වැඩියා කිරීම් සඳහා වන වැඩ පරීක්ෂා කිරීම. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| | | ● වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රමිතීන්ට අනුව එම කටයුතුවලදී පවරනු ලබන වගකීම් ඉටු කිරීම.<br>● අදාළ ක්ෂේත්‍රයේ වාරිමාර්ග හා උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීම යනාදී ව්‍යාපාරවල මෙහෙයුම් හා නඩත්තු වැඩ පරීක්ෂා කිරීම<br>● වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාරිමාර්ග, උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීමේ හා කරදිය වැළැක්වීමේ ව්‍යාපාර, ගොඩනැගිලි, පාරවල් සහ ඒවාට අයත් රක්ෂිත පිළිබඳව අවධානයෙන් සිටීම සහ ආරක්ෂා කිරීම. |
| 2 | තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | යාන්ත්‍රික වැඩපලට අළුත්වැඩියාව සඳහා පැමිණෙන යන්ත්‍ර හා වාහන භාර ගැනීම.<br>යාන්ත්‍රික අංශයට අනුයුක්ත කනිෂ්ඨ සේවකයින්ගේ රාජකාරී අධීක්ෂණය. |

2.0 *බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1 වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, ලකුණු ලබා දෙනු නොලැබේ.

3.0 *වැටුප් පරිමාණය* : මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන 1 අනුව රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890 (MT1-2016) වේ. එම චක්‍රලේඛනයේ උපලේඛන II අනුව 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා අදළ වනුයේ රු. 17,508 ක මූලික වැටුපක් හා රු. 9,831 ක ගැලපුම් දීමනාවකි.

4.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
4.2 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තාක්ෂණ සහායක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 3ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.
4.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදළ ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.
4.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

5.0 *වයස් සීමාව* :
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

6.0 *අවශ්‍ය සුදුසුකම්* :

6.1 අධ්‍යාපන සුදුසුකම් - භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

6.2 වෘත්තීය සුදුසුකම් :

තාක්ෂණ සහායක (වාරිමාර්ග) - තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධ කාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (සිවිල්) පාඨමාලාව සමත් වී අදළ සහතිකය (NCT-civil ) ලබා ගෙන තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම.

තාක්ෂණ සහායක (යාන්ත්‍රික) - තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධකාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (යාන්ත්‍රික) පාඨමාලාව සමත්වී අදළ සහතිකය (NCT-Mechanical) ලබා ගෙන තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම.

6.3 කායික සුදුසුකම්.-සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

6.4 වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.0 ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

8.0 විභාග පරිපාටිය :

විභාගය විෂයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

8.1 විභාගය සඳහාවන විෂය නිර්දේශය

1. බුද්ධි පරීක්ෂණය

තාක්ෂණ සහායක (වාරිමාර්ග) හා තාක්ෂණ සහායක (යාන්ත්‍රික) සඳහා :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුර සඳහා :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මූලික ගණිතමය දැනුම හා මූලික සිවිල් ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුර සඳහා :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මූලික ගණිතමය දැනුම හා මූලික යාන්ත්‍රික ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

8.2 මෙම විභාගය 2016 ඔක්තෝබර් මස කොළඹ නගරය තුළදී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

9.0 *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම* :

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1.0 සිට 6.0 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 7.0 සිට 11.0 දක්වා 02 පිටුවේද අංක 12.0 සිට 14.0 දක්වා 03 පිටුවේද, අංක 15, 04 පිටුවේද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

9.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින්ද රාජ්‍ය සංස්ථා පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මඟින්ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

9.3 අයදුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

9.4 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.6 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට බඳවා ගැනීම හෝ තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

9.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

10.0 *අයදුම්පත්‍ර යොමු කිරීම* :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016 අගෝස්තු මස 29 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

11.0 *විභාගයට පෙනී සිටීම* :

විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කල යුතුය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

12.0 *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13.0 මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ඉංජි. එස්. එස්. එල්. වීරසිංහ,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2016 ජූලි මස 27 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

***ආදර්ශ අයදුම් පත්‍රය***

*වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2016*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 1

දෙමළ - 2

(අදාළ කොටුව තුළ ලියන්න.)

2.0 අයදුම් කරනු ලබන තනතුරු නාමය :—————.
(එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.)

3.0 මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොද) : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :—————.
(උදා. PERERA, A. B. C. )

3.1 සම්පූර්ණ නම
සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :—————.

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 ස්ත්‍රී/පුරුෂභාවය (අදාළ කොටුව තුළ ලියන්න.)

පුරුෂ - M

ස්ත්‍රී - F

6.0 ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

6.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

7.0 දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

8.0 පදිංචිය :
8.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
8.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

9.0 විවාහක/අවිවාහක බව :

අවිවාහක -1 විවාහක -2 ☐

10.0 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

10.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2016.08.29 දිනට) වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

11.0 *අධ්‍යාපන සුදුසුකම්* :

11.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

පළමුවනවර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

11.2 අ. පො. ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

දෙවන වර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

12.0 වෘත්තීය සුදුසුකම් :

| *හදාරා ඇති පාඨමාලාව* | *පිරිනමනු ලැබූ ආයතනය* | *හදාරන ලද කාල සීමාව* | *සහතික පත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |

13.0 අයදුම්කරුගේ සහතිකය :—————.

................. වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහකරනු හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරාගැනීමට පෙර හෙළිවුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරාගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි. මා මෙම තනතුරට තෝරාපත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩබිම්වල රාජකාරි කිරීමට එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

14.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු /ඇය ............... වැනි දින මා ඉදිරිපිටදී ඉහත 13 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

—————.
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.) :—————.

15.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්පත් සඳහා පමණි)

.......................... මයා/මිය/මෙනවිය .............................. සේවයේ නියුතු ............... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත්, ........................ සේවයෙන් ඔහු/ඇය මුදා හැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

08-297/2

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### අධිකරණ කළමණාකරන සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියට, (සිංහල/ඉංග්‍රීසි/, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි) භාෂණ පරිවර්තකයන් තෝරා ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. *වැටුප් පරිමාණය* : රු. 28,940/10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 47,990

(2020.01.01 වැනි දින දක්වා රා.ප.ච. 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබේ. 2016.01.01 වැනි දිනට මූලික වැටුප රු. 16,980 හා ගැලපුම් දීමනාව රු. 9,859 කි. මීට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.)

04. *වයස*.-අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ නියුතු නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

05. අධ්‍යාපන සුදුසුකම් :- අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) සිංහල/දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයන්වලින් දෙකකට සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

*හා*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් ය.

(ඇ) වෙනත් ජාත්‍යන්තර භාෂා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

06. නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් යටතේ ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම විභාගයේ ප්‍රතිඵල මත නියමිත ලකුණු මට්ටමට එළඹ ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

I. *නිර්දේශ පත්‍රය* - භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සාහිත්‍යමය හෝ පොදු විෂයයන් පිළිබඳ වාක්‍ය රචනයක්, සාරාංශය ලිවීම හා අවබෝධය පිළිබඳ වෙනත් පරීක්ෂණ, වාග් මාලාව පිළිබඳ ප්‍රශ්න, වාග් සම්ප්‍රදාය හා එහි භාවිතය හා වැරදි නිවැරදි කිරීම ආදිය (මෙම ප්‍රශ්න පත්‍රය අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ තත්ත්වයට සමාන වනු ඇත.

II. *පරිවර්තනය* - මෙම විෂය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වනු ඇත. එනම් -

(අ) සිංහල, දෙමළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම,

(ආ) දෙමළ, සිංහල භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම,

(ඇ) ඉංග්‍රීසි, සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.

(අපේක්ෂකයින් විසින් සාහිත්‍යමය පාඨයක්, පොදු සැළකිල්ලට ලක් වූ පාඨයක්, නිල වාර්තාවකින් හෝ ලියවිල්ලකින් උපුටා ගත් පාඨයක්, පුවත්පත් ලිපියක හෝ වාර්තාවක් පරිවර්තනය කළ යුතුය.)

අපේක්ෂකයින් තම සුදුසුකම් අනුව ඉහත 6 (ii) යටතේ පරිවර්තන ප්‍රශ්න පත්‍ර දෙකකට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය. පරිවර්තන ප්‍රශ්න පත්‍ර දෙක තෝරා ගැනීමේ දී ඉහත 01 ඡේදය අනුව අපේක්ෂකයන් අයදුම්කරන තනතුරට අදාල භාෂා දෙක එකිනෙකට පරිවර්තනය වන පරිදි තෝරා ගත යුතුය. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා කාලය පැය දෙකකි.

*සටහන* : සියලුම උත්තර පත්‍රවල නොපැහැදිලි අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

07. සේවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

08. මෙම විභාගය සඳහා වූ ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලව පමණක් අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කිරිම අවශ්‍ය වේ. විභාගය සඳහා අයදුම් කිරීමේ දී පරිපාලන ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු. 500 ක මුදලක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් නමින් 'මහජන බැංකුවේ වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙනයන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත කොටුවේ ඇලවිය යුතු වේ.

09. අයදුම්පත් 2016.09.15 වැනි දිනට හෝ එදිනට පෙර **''ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.''** යන ලිපිනයට ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන

ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු වේ.

10. අයදුම්පත්‍ර සම්බන්ධව පැන නගින ගැටලු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

ප්‍රදීප් ජයතිලක,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2016 ජූලි මස 25 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

විභාග අංකය :
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

(*සැළකිය යුතුය*.- අයදුම්පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුවේ. අංක 01 සිට 10 දක්වා මුල් පිටුවල ඇතුළත් විය යුතුයි. අදාල කොටුවල නියමිත අංකය සඳහන් කරන්න.)

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
මයා/මිය/මෙය
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී/පුරුෂ

03. ස්ථිර ලිපිනය :————.

04. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.

05. පදිංචි දිස්ත්‍රික්කය :————.

06. දුරකථන අංකය : | | | | | | | | | | |

07. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

08. (අ) උපන් දිනය :————.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————.

අවුරුදු :————. මාස :————. දින :————.

09. අයදුම්කරන භාෂණ පරිවර්තක තනතුර :
1. සිංහල - දෙමළ
2. සිංහල - ඉංග්‍රීසි
3. දෙමළ - ඉංග්‍රීසි

(අංකය කොටුව තුළ සටහන් කරන්න)

10. පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන භාෂාව ප්‍රශ්න පත්‍ර :

(i) 1. සිංහල
2. දෙමළ
3. ඉංග්‍රීසි

(අංකය කොටුව තුළ සටහන් කරන්න.)

(ii) *පරිවර්තනය*
1. සිංහල, දෙමළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම.
2. දෙමළ, සිංහල භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම.
3. ඉංග්‍රීසි, සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.

(පෙනී සිටින පරිවර්තනය ප්‍රශ්න පත්‍ර දෙක ඉදිරියෙන් (✓) ලකුණ යොදන්න.)

11. රජයේ සේවයේ නියුක්ත නම්,
(i) අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

(ii) දැනට දරන තනතුර :————.

(iii) එම තනතුරට පත් කරන ලද දිනය :————.

(iv) එම තනතුරේ ස්ථිර කරන ලද දිනය හා ලිපි යොමුව :————.

(v) කාර්යාලයීය ලිපිනය :————.

12. සුදුසුකම් : *අධ්‍යාපන සුදුසුකම්*
(එක් එක් විභාගයේ ප්‍රතිඵල විභාග අංකය සහිතව වෙන් වෙන්ව සඳහන් කරන්න)

(*අ*) අ.පො.ස. (උසස් පෙළ) :

විභාග අංකය :————. වර්ෂය :————.

| *අනු අංකය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(*ආ*) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :

විභාගය අංකය :————. වර්ෂය :————.

| අනු අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ඇ) වෙනත් ජාත්‍යන්තර භාෂා පිළිබඳ දැනුම :————.

සටහන : අයදුම්කරුවන් විසින් චක්‍ර ලේඛයේ සඳහන් උපදෙස් පරිදි නියමිත වටිනාකම තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍රය ගැලවිය නොහැකි පරිදි මෙහි අලවන්න.

| |
|---|
| |

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත්, මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසු එම වරද දැනගන්නට ලැබුනහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බැව් මා දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මුදා හැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :————.

නම :————.

නිල මුද්‍රාව :————.

දිනය :————.

08-365

## අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03-2006A) පුහුණු කිරීමේ ශ්‍රේණිය හා III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03-2006A) සේවා ගණයට අදාල පහත තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අදාළ පුරප්පාඩු තනතුරු පහතින් දැක්වෙන අතර, පහත දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පතක් 2016.09.09 වැනි දිනට හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

01. සංරක්ෂණ සහකාර (වාස්තුවිද්‍යා/කාර්මික නිලධාරි) - 21
02. සැලසුම් ශිල්පී - 08
03. පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී - 07

02. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

I. බුද්ධි පරීක්ෂණය
II. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

*විභාග දිනය.*—මෙම විභාගය 2016 ඔක්තෝබර් මස කොළඹ නගරයේ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*—මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු ය. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලටද 2012.08.21 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03-2006A) තනතුරු සඳහා වන බඳවාග ැනීමේ පරිපාටියට අදාල සියලු කොන්දේසිවලටද එම බඳවාගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු (MN-03-2006A) III වැනි ශ්‍රේණියේ තනතුරකට හෝ පුහුණු ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද රාජකාරියෙහි හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරි භාරගැනීමට ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

04. මාසික වැටුප් පරිමාණය

රු. 31,040 - 445x10- 660x11 - 730x10 - 750-x10 - 57,550/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව)

(පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සහ II පන්තියේ පත්වීම් දින සිට වසර 03 ක් ඇතුලත 2 වැනි කාර්යක්ෂමතා කඩඉම ද I පන්තියේ පත්වීම් දින සිට වසර 05ක් ගතවීමට පෙර 3 කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය. පත්වීම් ලබා වසර 05ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය.)

05. *කායික සුදුසුකම් :*

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

06. *සුදුසුකම් :*

මේ සඳහා පෙනී සිටින අපේක්ෂකයෙකු-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. 2016.09.09 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 නොවැඩි විය යුතු ය.
IV. සුදුසුකම්

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය/ සංයුක්ත ගණිතය/ සත්ත්ව විද්‍යාව/ උද්භිද විද්‍යාව/ ජීව විද්‍යාව/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂයයන් 02 ක් සහිතව විද්‍යා විෂයයන් 03 කින් අ.පො.ස. (උ.පෙළ.) විභාගය එකවර සමත් වීම;

සහ

(ii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ.) විභාගය එකවර සමත් වීම;

සමඟ

(iii) පරිගණක වදන් සැකසුම/ යතුරුලියනය/ ලඝු ලේඛනය පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහතික පත්‍ර පාඨමාලාවක් සමත් වීම.

- ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් පමණක් සම්පූර්ණ කළ අයදුම්කරුවන් සේවයට අදාල විෂයය නිර්දේශයට අනුව ලබාගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III පන්තියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.
- පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන අධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ඇත.

(ආ) *වෘත්තීය සුදුසුකම් - පුහුණු කිරීමේ ශ්‍රේණිය*

* සංරක්ෂණ සහකාර (වාස්තුවිද්‍යා/ කාර්මික නිලධාරි) තනතුර සඳහා-
රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව)
* සැලසුම් ශිල්පී තනතුර සඳහා-
රජයේ පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.
* පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුර සඳහා-
රජයේ පිළිගත් වෘත්තීය එක් අවුරුදු පූර්ණ කාලීන හෝ දෑ අවුරුදු අර්ධ කාලීන වෘත්තීය පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

*සටහන :*

* අධ්‍යාපන සුදුසුකම් සමඟ (ආ) කොටසෙන් දක්වා ඇති වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සේවයට අදාළ විෂයය නිර්දේශය අනුව ලබාගන්නා එක් වසරකට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III පන්තියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.
* පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ඇත.

(ඇ) *වෘත්තීය සුදුසුකම් - III ශ්‍රේණිය*

* සංරක්ෂණ සහකාර (වාස්තුවිද්‍යා / කාර්මික නිලධාරි) සහ සැලසුම් ශිල්පී තනතුරු සඳහා

පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කර තිබිය යුතු ය :-

(i) මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාරේ හාඩි ආයතනයෙන් පිරිනමන ලද ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව.

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව.

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව.

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව.

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතිකය නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(vii) ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

- ➢ අධ්‍යාපන සුදුසුකම් සමඟ (ඇ) කොටසෙන් දක්වා ඇති වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් III පන්තියට අදාල වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

* පුරාවිද්‍යා ප්‍රතිරූපන ශිල්පී තනතුරු සඳහා-

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් පිරිනමනු ලබන ඡයාරූපකරණය පිළිබඳ ඩිප්ලෝමාව

(v) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍යය සුදුසුකම් 2016.09.09 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කල යුතු බැවින්, ශීර්ෂ අංක 1.0 සිට 4.1 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද 4.2 සිට 7.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද 8.0 සිට 10.0 තෙක් ශීර්ෂ තෙවන පිටුවට ද වන ලෙස සකස් කල යුතු අතර, ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කල යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුණහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. අයදුම්පත්‍ර මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකසන්න.

*සටහන* :-
ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම්පත්‍රය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් (www.archaeology.gov.lk) බාගත කල හැක.

(*ආ*) ඉල්ලුම්පත්‍ර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කල යුතු ය.

(*ඇ*) අයදුම්කරුවන් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. :-

(i). උප්පැන්න සහතිකය;
(ii). මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(iii). අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;
(iv). පදිංචිය සනාථ කරන ග්‍රාම නිලධාරී සහතිකය;
(v). වෙනත් වෘත්තීය සහතික;
(vi). සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික;
(vii). ජාතික හැඳුනුම්පත;

(*ඈ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2016.09.09 දින හෝ ඊට කලින් ලැබෙනු පිණිස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, ලිපිනය වෙත එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙලවරේ පැහැදිලිව "පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN -03 -2006A) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2016" යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතු ය. අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ඉ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360/- වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(*ඊ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

08. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍ය* :
විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

*සටහන* :

I. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
II. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

09. *විභාග ගාස්තුව*.—මෙම විභාගය සඳහා අයදුම්කරන අයදුම්කරුවකු රු. 1000/= ක විභාග ගාස්තුවක් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අළවන්න. එම කුවිතාන්සියේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. *තොරා ගැනීමේ ක්‍රමය*.—පහත සඳහන් විෂය නිර්දේශයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකින් මෙම විභාගය පවත්වනු ලබයි. ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එහිදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40%කට වඩා වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන්

අතරින් මුළු ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය. |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්‍ෂණය) | (*අ*) සැලසුම් ශිල්පී හා සංරක්ෂණ සහකාර (වාස්තුවිද්‍යා/ කාර්මික නිලධාරි) තනතුරු සඳහා- |

i. ඓතිහාසික ස්මාරක පිළිබඳ මූලික අවබෝධය
ii. වාස්තු විද්‍යා සංරක්ෂණය මූලධර්ම පිළිබඳ සාමාන්‍ය අවබෝධය
iii. ඇස්තමේන්තු සැලසුම් කිරීම./ ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම
iv. සැලසුම් ඇඳීම හා උපකරණ පිළිබඳ අවබෝධය ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම

(*ආ*) පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරු සඳහා

i. මූලික ඡයාරූප උපකරණ පිළිබඳ දැනුම
ii. ඡයාරූප ගැනීමේ තාක්ෂණ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම
iii. ඡායරූපකරණයට අදාළ රසායන ද්‍රව්‍ය පිළිබඳ දැනුම
iv. මුද්‍රණ කඩදාසි වර්ග පිළිබඳ දැනුම
v. ඡයාරූපකරණය පිළිබඳ මූලධර්ම

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය.—බඳවා ගැනීමේ සුදුසුකම් සහ ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම අපේක්ෂා කෙරේ.

09. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

*අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* : තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03-2006A) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016**

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

[ ]
(අයදුම්කරන තනතුර මෙහි සඳහන් කරන්න)

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] පුරුෂ - 0 ස්ත්‍රී - 1

3.2 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.3 2016.09.09 දිනට වයස :

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා/පෙළ.)
විභාගය සමත් වර්ෂය :————.
(i) විභාග අංකය :————.
(ii) ප්‍රතිඵල :

| අනු. අංකය | හදාරා ඇති විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

4.2 අ.පො.ස. (උ/පෙළ.)
විභාගය සමත් වර්ෂය :————.
(i) විභාග අංකය :————.
(ii) ප්‍රතිඵල :

| අනු. අංකය | හදාරා ඇති විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | වෘත්තීය සුදුසුකම | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න.)
(ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | | නැත | |
|---|---|---|---|

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

7.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9.0 ආයතන ප්‍රධානියාගේ සහතික කිරීම :

(රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................... මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ............................ ලෙස සේවය කරන අතර, ඔහුගේ/ ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08-283

## විදේශ කටයුතු අමාත්‍යාංශය

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත තරග විභාගය - 2015 (2016)

**Limited Competitive Examination for Filling of Vacancies in the Home Based Peronal Assistants' Posts in Sri Lanka Missions/Posts Abroad – 2015 (2016)**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ඇතිවන පුරප්පාඩු සඳහා ඉංග්‍රීසි ලසුලේඛනය හා පරිගණක භාවිතය පිළිබඳ සුදුසුකම් ලත් සියරට පේරුවේ පෞද්ගලික සහකාරවරුන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන්, පළාත් පාලන සේවයෙන්, රාජ්‍ය සංස්ථා/රාජ්‍ය බැංකු සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව :-*

(*අ*) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්කරු විවාහක නම් කලත්‍රයා ද ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 57ට නොවැඩි වූ ද, ඉංග්‍රීසි ලසුලේඛනය හා පරිගණක කටයුතු පිළිබඳ හැකියාව ඇති යටත් පිරිසෙයින් වසර 05 ක ස්ථිර අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන සේවයේ, රාජ්‍ය සංස්ථා/රාජ්‍ය බැංකු සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරීන් වීම.

*සටහන් :-* (i) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල දැනට සේවය කරන අය මේ සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ නොවෙති.

(ii) ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල සේවය කර ශ්‍රී ලංකාවට පෙරළා පැමිණ සිටින අයට, මෙම විභාගය සඳහා පෙනී සිටිය හැකිය. එසේ වුවත්, අවසන් වරට දූත මණ්ඩලයක සේවය සම්පූර්ණ කර ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව, අවම වශයෙන් මාස 12ක් වත් ගත කොට ඇති අය සඳහා ප්‍රමුඛත්වය ලබාදීමේ පදනම මත පත්වීම් ලබා දෙනු ලැබේ.

(iii) ඉහත 02 (ආ) යටතේ වන සේවාවන්හි කොන්ත්‍රාත්, අනියම් හෝ තාවකාලික පදනම මත සේවය කරන නිලධාරීන්ට උක්ත විභාගය සඳහා අයදුම් කළ නොහැක.

03. *තෝරා ගන්නා ක්‍රමය :-*

3.1 අයදුම්කරුවන් ඉංග්‍රීසි ලසුලේඛනය පිළිබඳව පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. මෙම පරීක්ෂණය කොළඹ දී, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. මේ සඳහා අවශ්‍යවන ලසුලේඛන වේගය වනුයේ මිනිත්තුවකට වචන 60 කි. මෙම ඉංග්‍රීසි ලසුලේඛන පරීක්ෂණය සඳහා ලකුණු 100ක් දෙනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් හෝ ලබා ගන්නා අය සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. එසේ වුවත්, ලිඛිත පරීක්ෂණයේ දී, ඉහත ලකුණු ප්‍රමාණ ලබා ගන්නා, සුදුසුකම්ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් තරම් නොසිටින අවස්ථාවල දී, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන කඩඉම් ලකුණු මට්ටම තීරණය කිරීමේ අවසන් තීරණය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුවනු ඇත.

3.2 ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්ගේ යෝග්‍යතාව හා අවශ්‍ය ලියකියවිලිවල සත්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පත්කරනු ලබන දූත මණ්ඩලය පිළිබඳ අවසන් තීරණය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලැබේ.

3.3 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

3.4 ලිඛිත පරීක්ෂණයේ දී ලකුණු 40% කට නොඅඩුව ලබා ගත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

ඊට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ඇත.

3.5 විභාගය සමත් අයදුම්කරුවන් විදේශ කටයුතු අමාත්‍යාංශයට මුද්‍රාහරින ලෙස දන්වා යවන විට එම අයදුම්කරුවන් නියමිත දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බාර ගත යුතු ය. යම් හෙයකින් නියමිත දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බාර ගැනීමට අපොහොසත් වුවහොත් ඒ බව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දැන්විය යුතු අතර, වැඩ බාර ගැනීමට නියමිත දින සිට සති හතරක කාලයක් තුළ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවයට වාර්තා කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්, පත්වීමක් භාර ගැනීමට නුසුදුසු අය සේ සලකා ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කළ හැක. තව ද, තෝරාගනු ලබන අයදුම්කරුවන්ට පත්වීම් ලිපි නිකුත් කර සති දෙකක් ඇතුළත, පත්වීම භාර ගන්නේ ද නැද්ද යන වග විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දැන්විය

යුතු අතර, එසේ නොවන අවස්ථාවක පත්වීම භාර නොගන්නා අයකු සේ සලකා කටයුතු කරනු ලැබේ.

04. *බඳවා ගැනීමේ කොන්දේසි* :-

4.1 (*අ*) තෝරාගනු ලබන නිලධාරියකු, විදේශ රටවල පිහිටි දූත මණ්ඩල වෙත පත්කර හැරීමට පෙර මූලිකව නිශ්චිත කාලසීමාවක් තුළ කොළඹ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතු ය. මෙම මූලික කාලසීමාවේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරන ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම අසතුටුදායක යැයි පෙනී ගියහොත් ඔහුගේ/ඇයගේ තෝරාගැනීම අවලංගු කළ හැකිය. අමාත්‍යාංශයේ සේවය කරන කාලසීමාව අමාත්‍යාංශයේ අවශ්‍යතාවය අනුව වෙනස් කළ හැකිය.

(*ආ*) පත්කරනු ලබන අවස්ථාවල දී, අදාළ දූත මණ්ඩලවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා අවශ්‍යතාවයට අනුකූලව හා නිලධාරියාගේ යෝග්‍යතාව හා දක්ෂතා (විදේශ භාෂා දැනුම ආදිය) පදනම් කර ගනිමින් සුදුසුකම් ලැබූවන් පත් කිරීම තීරණය කරනු ඇත. එවැනි පත්කිරීමක් තීරණය කිරීමේ දී නිලධාරියාගේ පෞද්ගලික අවශ්‍යතා හා දුක්ගැනවිලි (ළමයින්ගේ අධ්‍යාපනය ආදී) පිළිබඳව සලකා බැලීමට අමාත්‍යාංශය කිසිමාකාරයකින් බැඳී නොමැත. තව ද, මෙම තෝරාගැනීමේ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව, එම පවතින පුරප්පාඩු පිරවීමට ද අමාත්‍යාංශය බැඳී නොමැත.

4.2 තෝරාගත් නිලධාරියෙකු විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කිරීමෙන් අනතුරුව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලබන කොන්දේසි හා නියමවලට අනුකූලව සාමාන්‍යයෙන් වසර තුනක කාලසීමාවක් විදේශයේ සේවය කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් ගිවිසුමකට ද එළඹිය යුතුවේ. සේවයේ අවශ්‍යතාවය මත මෙම කාලය දීර්ඝ වීමට ද හැකියාව ඇත.

4.3 රජයේ සේවයේ (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/පළාත් පාලන සේවයේ) නිලධාරීන් තෝරාගනු ලැබුවහොත් වර්තමාන වැටුප් පරිමාණය මතම මින් ඉදිරියටත් වැටුප් ගෙවනු ලබන අතර සෙසු නිලධාරීන්ට මසකට රු. 15,610/- ක ස්ථිර වැටුපක් ගෙවනු ලැබේ. මීට අමතරව, ඔවුන් විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරන කාලය තුළ දී පවතින නිතීරීති හා රෙගුලාසි ප්‍රකාරව, අදාලවන්නා වූ විදේශීය දීමනාවක් ඔවුන්ට ගෙවනු ලැබේ.

4.4 තෝරාගත් නිලධාරියකු විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කරනු ලැබූ විට, අදාළ රටට යාමට හා ඊමට ගුවන් ගමන් ගාස්තු, විදේශයේ ඔහු/ඇය සේවය කරන කාලය තුළදී පත්වීම ලබන රටේ නවාතැන් පහසුකම් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු පරිදි, වෙනත් දීමනා සඳහා පිරිවැය, නිලධාරියා, ඔහුගේ / ඇයගේ කලත්‍රයා සහ යෝග්‍ය දරුවන් දෙදෙනෙකු සඳහා පමණක් රජය විසින් දරනු ලැබේ. (මේ සඳහා සුදුසුකම්ලත් දරුවන් යනුවෙන් අදහස් කරන්නේ වයස අවුරුදු 21ට අඩු අවිවාහක හා නිලධාරියාගෙන් යැපෙන දරුවන් වේ.)

05. *අයදුම් කිරීමේ ක්‍රමය* :-

5.1 මුද්‍රිත අයදුම්පත් නිකුත් කරනු නොලැබේ. අපේක්ෂකයන් මෙම දැන්වීමෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව, ඒ 4 කඩදාසියක 1 - 9 දක්වා කොටස් මුල් පිටුවටත්, 10 - 19 දක්වා කොටස් දෙවැනි පිටුවටත් ඉතිරිය තෙවැනි පිටුවටත් ඇතුළත් කොට සකසා ගන්නා අයදුම්පත් ස්වකීය අත් අකුරෙන්ම පුරවා ඉදිරිපත් කළ යුතු වේ.

අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍ය වේ.

***සටහන***.-රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවයේ අයදුම්කරුවන් සඳහා ආදර්ශ අයදුම්පත්‍ර අංක 1 ද, අනෙකුත් සේවාවන් සඳහා ආදර්ශ අයදුම්පත්‍ර අංක 2 ද භාවිතා කරන්න.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් තොරතුරු අසම්පූර්ණව සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙයින් ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්කරු විදේශ රටවල සේවය සඳහා යෝග්‍ය බවත්, තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම නිදහස් කළහැකි බවත්, අයදුම්පත්‍රයේ දක්වා තිබෙන විස්තර නිවැරදි බවත්, ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

5.2 අයදුම්පත් 2016 සැප්තැම්බර් 13 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලැබෙන

සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, ''විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පුරප්පාඩු පිරවීම සඳහා සියරට පේරුවේ පෞද්ගලික සහකාරවරුන් තෝරාගැනීම සඳහා විභාගය'' යනුවෙන් සඳහන් කළ යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සෙ. මී. 2 x සෙ. මී. 2 ප්‍රමාණයේ කොටුවක් තුළ පැහැදිලිව "P" ඉංග්‍රීසි අකුර දැක්විය යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

මෙම විභාගය 2016 නොවැම්බර් මස තුළ දී කොළඹ දී පැවැත්වෙනු ඇත.

06. *විභාග ගාස්තු* :- විභාග ගාස්තුව රු. 500/- කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් අලවන්න. කුවිතාන්සි අංකය, මුදල් ගෙවූ තැපැල් හෝ උප තැපැල් කාර්යාලය, ගෙවූ දිනය හා ගෙවන ලද මුදල අදාළ ස්ථානයේ සඳහන් කළ යුතු ය. කිසිම අවස්ථාවක දී, විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මුදල් ඇණවුම් හෝ මුද්දර මගින් ගෙවන විභාග ගාස්තු භාරගනු නොලැබේ. මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

07. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. අයදුම්පත් තැපෑලේ දී නැති වූ බවට හා ප්‍රමාද වූ බවට කරන පැමිණිලි සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

08. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් භාරගනු ලබන අතර ඔවුන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. අපේක්ෂකයන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බවට පුවත්පත් දැන්වීමක් පළකරනු ලැබේ. පුවත්පත් දැන්වීම පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ඇතුළත ප්‍රවේශ පත්‍ර නොලැබුණු අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ දී ඇති උපදෙස් අනුව ක්‍රියාකරමින් ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමඟ ඔබගේ ඉල්ලීම් ලිපිය විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත. (ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන්න).

විභාග ප්‍රවේශ පත්‍රයේ දක්වා ඇති උපදෙස් අනුව ඔබගේ අත්සන සහතික කරවා ගත යුතු ය. ඔබ විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී ම ඔබගේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

09. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී අපේක්ෂකයකුගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි.

10. අපේක්ෂකයකු වෙත විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම, විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අදාළ අපේක්ෂකයා සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස කිසිම ආකාරයකින් නොසැලකිය යුතු ය.

11. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවැති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

12. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විභාග පිළිබඳව අදාළ වන නීති හා රෙගුලාසිවලට අපේක්ෂකයන් යටත් විය යුතු ය. තව ද එවැනි නීති රීති උල්ලංඝනය කරන අයදුම්කරුවකු, විභාග කොමසාරිස් ජනරාල් විසින් ඔහු/ඇය වෙත පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්විය යුතු ය.

13. එමෙන්ම මෙම විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් අනුව, පවතින පුරප්පාඩු සඳහා සම්පූර්ණයෙන් පත් කිරීම හෝ පුරප්පාඩුවලින් කොටසක් සඳහා පත්කිරීම හෝ පත් නොකිරීම පිළිබඳ අවසන් තීරණය විදේශ කටයුතු ලේකම් සතු වේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

චිත්‍රාංගනී වාගිස්වර,<br>
ලේකම්,<br>
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 ජූලි මස 21 වැනි දින,<br>
විදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
තැ. පෙ. 583,<br>
''ජනරජ ගොඩනැගිල්ල''<br>
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය අංක 1

***විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා අයදුම්පත්‍රය - 2015 (2016)***

**Limited Competitive Examination for Filling of Vacancies in the Home Based Personal Assistants' Posts in Sri Lanka Missions/Posts Abroad –** 2015 (2016)

(රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවයේ අයදුම්කරුවන් සඳහා පමණි)

*අ කොටස*

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : GUNAWARDHANA H. M. S. K. )

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය :-
(i) කාර්යාලයීය (ඉංග්‍රීසියෙන්) :————.

(ii) පෞද්ගලික (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මේ ලිපිනයටය)

(iii) දුරකතන අංක :————.

03. (i) ස්ත්‍රී/පුරුෂභාවය :- ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

(iii) උපන් දිනය :-

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

(iv) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :-

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

04. විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1

විවාහක -2 [ ]

(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ඔහුගේ/ඇයගේ ජාතිය :————.

06. ළමයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, උපන්දින හා වයස :————.

07. කලත්‍රයා රැකියාවක නියැලී සිටී නම් ඒ පිළිබඳව විස්තරඃ (රාජ්‍ය නිලධාරියෙකු/නිලධාරිණියක වන්නේ නම් සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන්න). :—————.

08. අධ්‍යාපන සුදුසුකම් ( මාධ්‍ය ඇතුළුව) :—————.

09. රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවය යටතේ මුල් පත්වීම් දිනය :—————.

10. සේවය ස්ථිර කළ දිනය :—————.

11. වර්තමාන ශ්‍රේණිය හා එයට ඇතුළත් වූ දිනය :—————.

12. වර්තමාන වාර්ෂික වැටුප :—————.

13. වර්තමාන රාජකාරියේ ස්වභාවය :—————.

14. වේගය :- (i) ඉංග්‍රීසි ලඝු ලේඛනයේ :—————.

(ii) ඉංග්‍රීසි යතුරු ලේඛනයේ :—————.

15. ප්‍රවීණතාව :—————.
(i) ඉංග්‍රීසි භාෂාව :—————.
(ii) සිංහල/දෙමළ භාෂාව :—————.
(iii) පරිගණක සාක්ෂරතාව :—————.
(iv) වෙනත් විදේශීය භාෂා :—————.

16. අයදුම්කරු මීට පෙර සේවය කර ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතොත් ඒවායේ නම් හා සේවය කළ කාලසීමාවන් :—————.

17. වෙනත් සුදුසුකම් :—————.

18. සටහන් :—————.

නියමිත විභාග ගාස්තුව තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය පහත කොටුව තුළ ඇලවිය යුතු ය :-

| |
|---|
| |

(i) කුවිතාන්සි අංකය :—————.
(ii) තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
(iii) දිනය :—————.
(iv) ගෙවූ මුදල් ප්‍රමාණය :—————.

19. *අයදුම්කරුගේ සහතිකය* :-

2016............දිනට පෙරාතුව වසර පහක කාලසීමාවක් තුළ මා සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබෙන බවත්, (අවවාද කිරීම් හැර) කිසිදු විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බවත්, මෙම අයදුම්පතේ දක්වා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් මම ප්‍රකාශ කර සිටිමි. විභාග පැවැත්වීම හා සම්බන්ධ ක්‍රියා මාර්ගවලට අනුකූලව විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීති හා රෙගුලාසිවලට යටත් වන බව ද මා තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*ආ කොටස*

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

**(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කරනු ලැබීම සඳහා)**

2016 .............................. දිනට පෙර පස් අවුරුදු කාලසීමාව තුළදී ................................ මහතා/මිය/මෙනවිය,

(අ) ඔහුගේ/ඇයගේ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්,

(*ආ*) අවවාද කිරීමක් හැර වෙනත් කිසිමාකාරයක විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත්, මම නිශ්චය වශයෙන් සොයා දැනගතිමි.

මෙම අයදුම්පතෙහි සඳහන් විස්තර නිවැරදි ඒවා බව මම සහතික කරමි. විභාග ගාස්තු ගෙවා ඇති බවත්, ඒ පිළිබඳ කුවිතාන්සිය යාකොට ඇති බවත් මෙයින් සහතික කරමි. මෙම නිලධාරියා/නිලධාරිණිය මා ඉදිරිපිට දී අත්සන් කරන ලද අතර, එම අත්සන සහතික කරමි.

මෙම නිලධාරියා/නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වර්තමාන තනතුරෙන් වහාම නිදහස් කළ හැකිය.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

නම :————.

පදවි නාමය :————.

දිනය :————.

ආදර්ශ ආකෘති පත්‍රය 2

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ
පෞද්ගලික සහකාර තනතුරු සඳහා අයදුම්පත්‍රය - 2015 (2016)

**Limited Competitive Examination for Filling of Vacancies in**
**the Home Based Personal Assistants' Posts in Sri Lanka Missions/Posts Abroad – 2015 (2016)**

(රාජ්‍ය / පළාත් රාජ්‍ය /පළාත් පාලන සේවය නොවන අනෙකුත් අයදුම්කරුවන් සඳහා පමණි)

*අ කොටස*

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

01. (i) සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (*උදා*: GUNAWARDHANA H. M. S. K. )
(iii) සම්පූර්ණ නම(සිංහලෙන්/ දෙමළෙන්) :————.

02. ලිපිනය :-
(i) කාර්යාලයීය (ඉංග්‍රීසියෙන්) :————.
(ii) පෞද්ගලික(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මේ ලිපිනයටය)
(iii) දුරකථන අංක :————.

03. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(iii) උපන් දිනය :-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(iv) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :-

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

04. විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1

විවාහක -2

(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ඔහුගේ / ඇයගේ ජාතිය :—————.

06. ළමයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, උපන්දින හා වයස :—————.

07. කලත්‍රයා රැකියාවක නියලී සිටි නම් ඒ පිළිබඳව විස්තරඃ (රාජ්‍ය නිලධාරියෙකු / නිලධාරිණියක වන්නේ නම් සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන්න). :—————.

08. අධ්‍යාපන සුදුසුකම් (මාධ්‍ය ඇතුළුව) :—————.

09. අයදුම්කරු/අයදුම්කාරිය අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙර පස් වස තුළ සේවයකළ ආයතනවල නම් සහ සේවා කාල :—————.

| *ආයතනයේ නම* | *පදවිය* | *කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

10. සේවය ස්ථිර කළ දිනය :—————.

11. වර්තමාන ශ්‍රේණිය හා එයට ඇතුළත් වූ දිනය :—————.

12. වර්තමාන වාර්ෂික වැටුප :—————.

13. වර්තමාන රාජකාරියේ ස්වභාවය :—————.

14. වේගය :- (i) ඉංග්‍රීසි ලඝු ලේඛනයේ :—————.

(ii) ඉංග්‍රීසි යතුරු ලේඛනයේ :—————.

15. ප්‍රවීණතාව :—————.
   (i) ඉංග්‍රීසි භාෂාව :—————.
   (ii) සිංහල / දෙමළ භාෂාව :—————.
   (iii) පරිගණක සාක්ෂරතාව :—————.
   (iv) වෙනත් විදේශීය භාෂා :—————.

16. අයදුම්කරු මීට පෙර සේවය කර ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතොත් ඒවායේ නම් හා සේවය කළ කාලසීමාවන් :—————.

17. වෙනත් සුදුසුකම් :—————.

18. සටහන් :—————.

නියමිත විභාග ගාස්තුව තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය පහත කොටුව තුළ ඇලවිය යුතු ය :-

(i) කුවිතාන්සි අංකය :—————.
(ii) තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
(iii) දිනය :—————.
(iv) ගෙවූ මුදල් ප්‍රමාණය :—————.

19. *අයදුම්කරුගේ සහතිකය :-*

මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළිදරව් වුවහොත් තෝරා ගැනීමට පෙර මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියකින් තොරව සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බවත් මම දනිමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

——————,
අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන.

දිනය :——————.

**ආ කොටස**

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

**(ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කරනු ලැබීම සඳහා)**

අයදුම්කරු/අයදුම්කාරිය වන .............................. මහතා/මිය/මෙනවිය ................................ දින සිට මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත් ........................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත් මෙයින් සහතික කරමි. තව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

මෙම නිලධාරියා/නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම නිදහස් කළ හැකි ය.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව)

නම :——————.

පදවි නාමය :——————.

ලිපිනය

දිනය :——————.

08-413

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සංවර්ධන නිලධාරි බඳවාගැනීමේ පරිපාටියේ 7.2 වගන්තිය අනුව සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 12 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

*විභාග දිනය* :-විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 නොවැම්බර් මස කොළඹ දී විභාගය පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ට බලය ඇත.

01. *පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය :-*

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය සමුපකාර සංවර්ධන කොමසාරිස්/ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට සමුපකාර සංවර්ධන කොමසාරිස්/ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ට බලය ඇත.

02. *සේවා කොන්දේසි :*

(i) සාමාන්‍ය *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (II ආ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, සමුපකාර සංවර්ධන නිලධාරී බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසිවලට ද, එම බඳවාගැනීමේ පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු

ලබන අපේක්ෂකයින් සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(iii) මෙම තනතුරට බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iv) තනතුරට පත් කරනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කිරීම පහත සඳහන් කරුණු මත ද රඳා පවතී. :-

(*අ*) වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වීම,

(*ආ*) පරිවාස කාලය අවසන්වීමට පෙර, අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම,

(*ඇ*) තනතුරට බඳවාගෙන වසරක කාලයක් තුළ "සමුපකාර සංවර්ධනය" පිළිබඳ වසර 01 කට නොඅඩු හා පැය 500 කට නොඅඩු පූර්ණ කාලීන සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරිය යුතු ය. මෙම පාඨමාලාවට අවම වශයෙන් මාස 03 ක ප්‍රායෝගික අභ්‍යාස ඇතුළත් වේ. මෙම පාඨමාලාව ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන අතර, අවසානයේ දී ආයතනික විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයක් සඳහා ලකුණු 100කින් සමන්විත ප්‍රශ්න පත්‍ර 12 කි. සමත්වීම සඳහා අවම ලකුණු 40 බැගින් ලබා ගත යුතු ය. මෙම විභාගය අසමත් වුවහොත් සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරේ සේවය අවසන් කරනු ලැබේ.

(v) පරිවාස කාලය අවසානයේ දී තනතුරුවල ස්ථිර කරනු ලැබීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ/ඇයගේ සේවය අවසන් කිරීමට සිදුවනු ඇත.

(vi) තනතුරට බඳවාගැනීමෙන් පසු වසර පහක් (05 ක්) ඇතුළත 2014 ජනවාරි 21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(vii) තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලට හා සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I ට අනුව, මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MN-3-2016 වේ. (31,040-10x445-11x660-10x730-10x750-රු. 57,550). නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. (*උදා.*-2016.01.01 දින සිට 2016.12.31 දක්වා අදාළ වනුයේ රු. 18,212.00 ක මූලික වැටුපක් හා රු. 9,794.00 ක ගැලපුම් දීමනාවකි.)

04. *සෞඛ්‍ය හා විනය* :-

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

05. *සුදුසුකම්* :-

සෑම අපේක්ෂකයෙකුම,

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.;

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1998.09.09 දින හෝ ඊට පෙර හා 1986.09.09 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.;

(*ඇ*) යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.;

(*ඈ*) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය. :-

(i) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම,

සහ

(ii) ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එක්වර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.;

(ඉ) පහත සඳහන් වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. :-

(i) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණ හෝ විගණන හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම හෝ,

(ii) ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත්ව තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම හෝ,

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

(ඊ) සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *විභාග ගාස්තු* : මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.600/- කි. එම විභාග ගාස්තුව, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස අයැදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

07. *අයදුම්කිරීමේ ක්‍රමය* :

(අ) අයදුම් පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම පාවිච්චි කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

(ඇ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016.09.09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සමූපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. තව ද, ඔහු/ඇය විභාගයට ඇතුළත් කර ගැනීම ඊට යෝග්‍ය පිළිගැනීමත් බවට පත් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම හුදෙක් තත්කාලීන පසු අවශ්‍යතාවක දී පරීක්ෂා කර බැලීමට යටත් වන්නකි.

(ඉ) අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම් පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවීම සඳහා ෆැක්ස් අංකයක් හා ඉහත විස්තර සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(ඊ) විභාග අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියෙකු, හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවාගත යුතු ය.

08. *විභාගයට ඇතුල්වීම* :-

(අ) නිවැරදිව අයදුම්පතක් යොමුකොට ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළකර ඇත.

(ඇ) අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය

කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—තමා පෙනීසිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම.*—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. *විභාග ක්‍රමය* :

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම විභාගයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්ලත් විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පමණි.

සටහන.—(i) ඉහත (ආ) හි සඳහන් "සුදුසුකම් ලත් විභාග" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 05 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

12. *පරීක්ෂා කිරීමේ ක්‍රමය* :

(අ) පහත සඳහන් විෂයයන් දෙක සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයක් මඟින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

| | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | පැය 01 |
| 2. සාමාන්‍ය දැනීම | 100 | පැය 01 |

1. *බුද්ධි පරීක්ෂණය* : අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයන්ද, විශ්ලේෂණ හැකියාවන්ද, තීරණ ගැනීමේ ශක්තීන්ද, විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

2. *සාමාන්‍ය දැනීම* : (අ) ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික හා දේශපාලන දැනුම සහ,

(ආ) ජාතික හා ජාත්‍යන්තර සමූපකාර දර්ශනය හා ව්‍යාපාරය පිළිබඳ දැනුම විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින්, සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ආ) මෙම විභාගය තරඟ විභාගයක් වුව ද පත්වීමක් දීමට තෝරාගැනීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙන් සියයට හතලිහක්වත් (40%) ලබා ගන්නා අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට යෝග්‍යවන අතර, ලිඛිත පරීක්ෂණයෙන් පසු දැනුම් දෙනු ලබන දිනයක දී සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනුයේ අයදුම්කරුවන්ගේ සුදුසුකම්, පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

13. *පත්කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය* :-
ලිඛිත පරීක්ෂණයෙන් ප්‍රශ්න පත්‍ර 02 ට ලබාගත් ලකුණු අනුව ඉහළම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් තෝරාගනු ලැබේ. අපේක්ෂකයින් කිහිපදෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් සතු වේ.

14. 12 (ආ) ඡේදයට අනුව සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් වෙත ලබාදීමෙන් අනතුරුව විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මගින් හෝ www.results. exams. gov.lk විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

15. ඉහත රෙගුලාසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මතුවන ගැටළු පිළිබඳ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් තීරණය කරනු ඇත.

16. මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

ඩී. ජීවනාදන්
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්.

2016 ජූලි මස 29 වැනි දින,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

ආදර්ශ අයදුම්පත්‍රය

*සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට*
*බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016*

Open Competitive Examination For Recruitment to Grade III of
Cooperative Development Officer - 2016

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 ස්ත්‍රී/ පුරුෂ භාවය :- [ ] (අදළ අංකය කොටුව තුළ ලියන්න.)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

4.0 උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

2016.09.09 දිනට වයස අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

5.0 *අධ්‍යාපන සුදුසුකම්* :

5.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 3. | |
| 4. | |

5.3 පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,

(i) විශ්වවිද්‍යාලය :
(ii) උපාධිය :
(iii) විභාග වර්ෂය :

6.0 වෘත්තීය සුදුසුකම් :

(i) ————.

(ii) ————.

(iii) ————.

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න) ඔව් ☐ නැත ☐

''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න :————.

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br><br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.) |
|---|

9.0 *අයදුම්කරුගේ සහතිකය* :

(*අ*) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමේ සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

(*ඇ*) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. (*අ*) *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී .............. වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

............................ මහතා/ මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ .......................... වශයෙන් ස්ථිර/තාවකාලික/ අනියම් නිලධාරියෙකු/නිලධාරිණියක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.

08-390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.